TIP SHEET 5

# විරෝධතා, සිවිල් නොසන්සුන්තා වාර්තා කිරීම

## ඡායාරූප මාධ්‍යවේදීන් සඳහා ආරක්ෂක උපදෙස්

Internews
Local voices. Global change.

ඡායාරූප මාධ්‍යකරණය එයට අනන්‍ය වූ සුවිශේෂ කාර්ය තත්ත්වයන් හා බැඳී පවතී. ඔබ භාවිත කරන උපකරණ සහ ඔබේම ආරක්ෂාව කෙරෙහි අවධානය යොමු කරන අතරතුරේ දී යම් සිදුවීමක් පවතින ස්ථානයන්ට ඉතා සමීපව කැමරාකරණය සිදුකිරීමට ඔබට සිදුවේ. කැමරා ඇස හරහා සිදුවීම් දෙස බලාසිටීම මගින් ඔබේ සම්පූර්ණ අවධානය කැමරාකරණය වෙත යොමුවන බව සිහිතබා ගත යුතුය. මේ නිසාම ඇතැම් විට බාහිර පරිසරයේ ඔබ අවට කුමක් සිදුවේ ද යන්න ග්‍රහණය කර ගැනීමට ඔබ අපොහොසත් වීමේ අවදානමක් පවතින බව ද සිහි තබා ගත යුතුය.

## පෙර සූදානම් වීම

ඔබේ මාධ්‍ය ආවරණය වෙත පිටත්ව යාමට පෙර, විරෝධතාව පවතින ස්ථානය, එහි පිවිසුම් මාර්ග, ප්‍රවාහනය, විරෝධතාවට සම්බන්ධ පාර්ශ්ව සහ විරෝධතාවල සාමාන්‍ය වාතාවරණය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

ඒ සඳහා ඔබේ සගයන් සමග කතා කරන්න, විශේෂයෙන්ම විරෝධතා මුලින්ම ආවරණය කළ අය සමග සාකච්ඡා කර එහි වාතාවරණය අවබෝධ කරගන්න. අවශ්‍ය තොරතුරු සඳහා සමාජ මාධ්‍ය සහ Chat Group පරිහරණය කළ හැක.

විශේෂයෙන් ඔබ සංවේදී උපකරණ සමග වැඩ කරන්නේ නම්, කාලගුණය පිළිබඳව අදහසක් තබාගැනීම ප්‍රයෝජනවත්ය.

වාර්තා කිරීම සඳහා ඔබ භාවිත කරන උපකරණ මොනවාද, ඔබ ඒවා ප්‍රවාහනය කරන්නේ කෙසේද සහ ඒවා සඳහා රක්ෂණ ආවරණයක් පවතීද යන්න පිළිබඳව හොඳ සැලැස්මක් තබා ගන්න. හැකි සෑම විටම අවම උපකරණ ප්‍රමාණයක් රැගෙනයාමට සැලකිලිමත්වන්න.

ඔබේ සගයන් සහ ආදරණීයයන් සමග ශක්තිමත් පිරික්සුම් සැලැස්මක් සකස් කර එය ක්‍රියාවට නංවන්න.

ඔබේ වාර්තාකරණය සහ ලබා ගැනීමට බලාපොරොත්තුවන ඡායාරූප පිළිබඳ පැහැදිලි අදහසක් සිතේ තබා ගන්න.

## වාර්තාකරණය අතරතුර/ අදාල ස්ථානයන්හි දී

අදාළ ස්ථානයට කල්වේලා ඇතිව පැමිණෙන්න. එමගින් පැවරුම සහ ස්ථානය පිළිබඳව මනා අවබෝධයක් ලබාගැනීමට ඔබට කාලය ලැබෙනු ඇත. අදාළ ස්ථානයට ජනතාව විශාල වශයෙන් පැමිණීමට පෙර සහ එහි උණුසුම්කාරී වාතාවරණයක් ඇතිවීමට පෙර එහි ළඟා වී සිටීම ඔබට පහසුවක් වනු ඇත.

එම ස්ථානයේ පිරිස් ස්ථානගත ව සිටින ආකාරය ගැන විමසිලිමත් වන්න. විශේෂයෙන්ම ආරක්ෂක අංශ සහ විරෝධතාකරුවන් සිටින ස්ථාන පිළිබඳව අවධානය යොමු කළ යුතුය. එවිට ඔබට එම කණ්ඩායම් දෙක හෝ වෙනත් කණ්ඩායම් අතර මැදි නොවී ආරක්ෂාව සලසා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

ඔබ ඡායාරූපගත කරන පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වයට ගරු කරන අතරතුර විරෝධතා ඉතා අස්ථිර සහ කඩිනමින් වෙනස් විය හැකි බව සැමවිටම මතක තබා ගත යුතුය.

තමන්ගේ ආරක්ෂාවට ඉතා විශාල තර්ජනයක් නොවේනම් පමණක් සැමවිටම මාධ්‍යවේදී හැඳුනුම්පත පැළඳ ඔබගේ අනන්‍යතාව ප්‍රදර්ශනය කරන්න. ඔබ අදාල ස්ථානයේ සිටීම පිළිබඳව කිසිවෙකුට හෝ සැකයක් ඇතිකරගැනීමට ඉඩක් ඉතිරි නොකරන්න.

සෑම විටම එම ස්ථානයෙන් ඉවත්ව යාමට සැලැස්මක් තබා ගත යුතුය.

රැකියා ස්ථානයෙන් ඉල්ලා සිටින දර්ශන හා ඡායාරූප පිළිබඳ වගකීම නිසාම ඔබ අවට ඇති තත්ත්වය ඔබට නොපෙනී යා හැකි බව සිහියේ තබා ගත යුතුය.

හැකිතාක් දුරට, ඔබේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශ්වාස කළ හැකි, විශ්වාසවන්ත මාධ්‍ය සගයන් පිරිසක් සමඟ හෝ ඔවුන් අතරට වී ඡායාරූපකරණයේ යෙදීම ආරක්ෂිතය.

ඔබේ ආරක්ෂාව කිසිවිටෙක අවතක්සේරු නොකළ යුතුය.

පවතින ආරක්ෂක අවදානම් සහ ඒවාට මුහුණදීමට ඇති ඔබේ සැලසුම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් පවත්වා ගත යුතුය.

දෘශ්‍ය වාර්තාකරුවන් ලෙස යම් සිදුවීමක් දුරස්ථව වාර්තා කිරීම ඔබට ඇති විකල්පයක් නොවේය. එබැවින් ඔබ ගමන් කරන විට, සෑම විටම ඔබගේ ආරක්ෂක තත්ත්වය අඛණ්ඩව තක්සේරු කිරීමට උපකාර වන කුසලතා ගොඩනගා ගත යුතුය.